# ඉල්ලුම්කරුවන් සඳහා උපදෙස්

පී 01 ආකෘතියට අනුව ඇති ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ගොනුගත කිරීමට ප්‍රථමයෙන් අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන උපදෙස් කෙරෙහි අවධානය යොමුකළ යුතුය.

- ඉල්ලුම් පත්‍රයේ (පී 01) කොටු අදාල වන විට අනිවාර්යෙන් පිරවිය යුතුය.
- මෙම ආකෘතියට (පී 01) අනුව පමණක් ඉල්ලුම් පත්‍ර සකස් කළ යුතුය.
- පහත දැක්වෙන කාණ්ඩ තුන යටතේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ හැක.

දේශීය පේටන්ට් ඉල්ලුම් පත්‍ර සඳහා:

| කාණ්ඩය | සෝදිසි කිරීමේ ගාස්තුව සමඟ ගාස්තු ව්‍යුහය | 15% වැට් ගාස්තුව සමඟ |
|---|---|---|
| සිසුන් | රු. 2000.00 | රු. 2300.00 |
| තනි පුද්ගලයින් | රු. 3500.00 | රු. 4025.00 |
| වෙනත්(ආයතන) | රු.7000.00 | රු. 8050.00 |

පේටන්ට් සහයෝගීතා ගිවිසුම යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර සඳහා:

| කාණ්ඩය | සෝදිසි කිරීමේ ගාස්තුව සමඟ ගාස්තු ව්‍යුහය | 15% වැට් ගාස්තුව සමඟ |
|---|---|---|
| සිසුන් | රු. 1000.00 | රු. 1150.00 |
| තනි පුද්ගලයින් | රු. 2500.00 | රු. 2875.00 |
| වෙනත්(ආයතන) | රු. 6000.00 | රු. 6900.00 |

- සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය පිටපත් 02කින් යුක්තව අනිකුත් අදාල ඇමුණුම්/ ලේඛන සමඟ පහත ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත භාරදිය යුතුය.

3 වන මහල, සමාගම් මැදුර, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.

## P 01 ඉල්ලුම් පත්‍රය පිරවීම සඳහා උපදෙස්

## පිටු අංක - 01

කොටු අංක I - පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරන ලෙස ඉල්ලීම

### කොටු අංක II – නව නිපයුමේ නම

*නව නිපැයුමේ නම විස්තරාත්මක හා විශේෂිත විය යුතු අතර එමඟින් නව නිපැයුම කෙටි යෙදුම් වලින් තොරව (without any abbreviation) විස්තරාත්මකව හඳුන්වා දියයුතු අතර නව නිපැයුම අයත් වන කාණ්ඩයද පෙන්නුම් කළ යුතුය.*

උදාහරණ වශයෙන්:

***චොක්ලට් ඇසුරුම් කිරීමේදී ඇසුරුම් කඩදාසි නැවීම සඳහා ක්‍රියාවලිය***
***ආහාර පිසීම සඳහා උපකරණය***
***උණුසුම් පානවර්ගයක් සැකසීම සඳහා ක්‍රමවේදය***
***මැලේරියා ප්‍රතිකාර සඳහා සංයෝගය***
***දුරකතනය තැබීම සඳහා උපාංගය***

## <u>කොටු අංක III – ඉල්ලුම්කරු</u>

පේටන්ට් බලපත්‍රය සඳහා අයිතිය හිමිවනුයේ ඉල්ලුම්කරුට/ඉල්ලුම්කරුවන්ට වේ.
ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන් තනි පුද්ගලයෙක්/ පුද්ගලයින් කිහිපදෙනෙක්, සමාගමක්/ සමාගම් කිහිපයක් හෝ ආයතනයක්/ ආයතන කිහිපයක් හෝ විශ්ව විද්‍යාලයක්/ විශ්ව විද්‍යාල කිහිපයක් විය හැකිය.

### නම:

*ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් විසින් වාසගම/වාසගම් සහිතව සිය සම්පූර්ණ නම සඳහන් කළ යුතුය.*

*උදා: **හේරත් මුදියන්සේලාගේ රංජිත් කුමාර හේරත්***

### ලිපිනය:

*තැපැල සඳහා යොමුකරනු ලබන ලිපි ඉක්මනින් නියමිත පරිදි ලැබීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි අදාල පරිපාලන ඒකක ආදිය හා නිවාස සඳහා අංකයක් ඇතොත් ඒවාද නිවැරදිව සඳහන් කර ලිපිනය/ ලිපිනයන් දැක්විය යුතුය. ලිපිනයේ අදාල රටද සඳහන් කළ යුතුය.*

*උදා: **නො.125, ජාවත්ත පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව***
***(අයදුම්කරුවන් එක් අයෙකුට වඩා වැඩිවන අවස්ථාවකදී, අදාල විස්තර වෙනම කඩදාසියක ඉදිරිපත් කළ යුතුය.)***

### ශ්‍රී ලංකාවේ පදිංචිය නොමැතිනම් ලිපි බාරදීම සඳහා ලිපිනය:

*ශ්‍රී ලංකාව තුළ පදිංචි ස්ථානයක් හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයක් නොමැති ඉල්ලුම්කරුවන් (දේශීය වශයෙන් නිත්‍ය පදිංචිය නොමැති ඉල්ලුම්කරුවන්) නියෝජනය කිරීම සඳහා වෘත්තිමය නියෝජිතයකු සිටිය යුතු අතර, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සමඟ සිදුකරන සියලුම ක්‍රියාවලි ඔහු/ඇය හරහා සිදුකළ යුතුය. එවැනි අවස්ථාවකදී එම වෘත්තීය නියෝජිතයකු නියමිත කාලවකවානුව තුළදී පත්කර ගත යුතු අතර අප්‍රමාදව සිදුවිය යුතු ලිපි ගනුදෙනු සඳහා ඔවුන්ගේ ලිපිනය/ලිපිනයන් කාර්යාලයට දැන්විය යුතුය.*

### දුරකතන අංකය/ෆැක්ස් අංකය / විද්‍යුත්-තැපැල් ලිපිනය:

*අනු නියෝජිතයකු හෝ පොදු නියෝජිතයකු සඳහන් කර නොමැති නම් අදාල ඉල්ලීමේ පළමුව සඳහන් කර ඇති ඉල්ලුම්කරුගේ දුරකතන අංකය, ෆැක්ස් අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය ලබාදීමට නිර්දේශ කරනු ලැබේ.*

## <u>කොටු අංක IV – නව නිපැයුම්කරු</u>

නව නිපැයුම්කරු යනු නව නිපැයුම නිපදවීම සඳහා දායක වූ පුද්ගලයා වේ. නව නිපැයුම්කරුවන් කණ්ඩායමක් වුව සිටිය හැක.

**නම/ලිපිනය**
*වාසගම/ වාසගම් සහිතව නව නිපැයුම්කරු/ නව නිපැයුම්කරුවන්ගේ සම්පූර්ණ නම් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය. (එක් නව නිපැයුම්කරුවකුට වඩා සිටීනම්, වෙනම කඩදාසියක අදාල විස්තර සැපයිය යුතුය.)*

*සටහන: රජයේ සේවයේ නියුක්ත වූවන් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.*

## පිටු අංක - 02

## <u>කොටු අංක V – අනුනියෝජිත *(ඇත්නම්)*</u>

ඉල්ලුම්කරු විසින් අනුනියෝජිතයකු/ නියෝජිතයකු පත් කර ඇතිනම් <u>පමණක්</u>, මෙම කොටුව සම්පූර්ණ කළ යුතුය.

අනුනියෝජිතයකු විසින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කරන්නේ නම් (ලියාපදිංචි අනුනියෝජිතයන් සම්බන්ධ විස්තර දැනගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.) අනු නියෝජිතගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුය. *දේශීය වශයෙන් නිත්‍ය පදිංචිය නොමැති ඉල්ලුම්කරුවන්* සිය ඉල්ලුම් පත්‍ර අනුනියෝජිතයකු හරහා ගොනු කළයුතු අතර, ඇටෝනි බලය පැවරීමේ විස්තරය ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. (ශ්‍රී ලංකාවේ නිත්‍ය

පදිංචිකරුවන්ට/ දේශීය ඉල්ලුම්කරුවන්ට අනුනියෝජිතයකු පත් කර ගැනීමෙන් තොරව සිය ඉල්ලුම් පත්‍ර ගොනු කළ හැක.)

## කොටු අංක VI – **පේටන්ට් බලපත්‍රයට ඉල්ලුම්කරුගේ අයිතියේ පදනම**

අදාල කොටුවට කතිරයක් යොදන්න.

(ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන් අදාල නව නිපැයුමේ නිපැයුම්කරු/නව නිපැයුම්කරුවන් නොවන අවස්ථාවකදී, එකී පේටන්ට් බලපත්‍රයට ඉල්ලුම්කරුට/ඉල්ලුම්කරුවන්ට ඇති අයිතිවාසිකම් යුක්ති සහගත බව පෙන්නුම් කරන ප්‍රකාශයක් හෝ ඒ සඳහා නව නිපයුම්කරු/නව නිපැයුම්කරුවන්ගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශයක්/ ප්‍රකාශන (consent letter/s) ඉදිරිපත් කළ යුතුය.

## කොටු අංක VII – ලියාපදිංචි කිරීමේදී ස්වකීය නම පේටන්ට් බලපත්‍රයේ සඳහන් නොකිරීමට නව නිපැයුම්කරු විසින් කරනු ලබන ඉල්ලීම

ලියාපදිංචි කිරීමේදී සිය නම පේටන්ට් බලපත්‍රයේ සඳහන් නොකිරීම සඳහා සිය කැමැත්ත ලබාදීම සම්බන්ධව නව නිපැයුම්කරු විසින් හෝ/ ඔහු වෙනුවෙන් කරනු ලබන ලිඛිත ප්‍රකාශයක් අත්සන් සහිතව අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු නොලබන්නේ නම්, පේටන්ට් බලපත්‍රයේ නව නිපයුම්කරුගේ නම සඳහන් වනු ඇත. අදාල වන්නේ නම් පමණක් මෙම ප්‍රකාශය ඉදිරිපත් කළ යුතුය.

## කොටු අංක VIII – **ඉල්ලුම්පත්‍රය විභජනය කිරීම**

විභජිත ඉල්ලුම් පත්‍රයක් ( සමහර අවස්ථාවලදී විභජිත ඉල්ලුම් පත්‍රය හෝ සරලව විභජිත යනුවෙන් සඳහන් වන) යනු පෙර ගොනු කළ ඉල්ලුම් පත්‍රයක ( **මුල් ඉල්ලුම්පත්‍රය** ලෙස හැඳින්වෙන) අන්තර්ගත කරුණු අඩංගුවන පේටන්ට් ඉල්ලුම්පත්‍රයකි. මුල් ඉල්ලුම් පත්‍රයට පසුව විභජිත ඉල්ලුම් පත්‍රය ගොනු කළද මුල් ඉල්ලුම්පත ගොනුගත කළ දිනයම ලබාගත හැකි අතර, මුල් ඉල්ලුම් පත්‍රයට අදාළ ප්‍රමුඛතාවයටම සාමාන්‍යයෙන් හිමිකම් ලැබිය හැක.

මුල් ඉල්ලුම්පත්‍රයේ නව නිපැයුමට අදාල ඒකීභාවය රහිත අවස්ථාවන්හිදී, සාමාන්‍යයෙන් විභජිත ඉල්ලුම්පත්‍ර භාවිතා කරනු ලැබේ; එනම් මුල් ඉල්ලුම්පත්‍රයෙන් නව නිපැයුම් එකකට වැඩි ගණනක් විස්තර කෙරෙන අතර, අයදුම්කරුට අදාල මුල් අයදුම්පත්‍රය එක් නව නිපැයුමක් සඳහා පමණක් හිමිකම් ඉල්ලා සිටින විභජිත ඉල්ලුම්පත්‍ර දෙකකට හෝ ඊට වැඩි ගණනකට විභජනය කිරීමේ අවශ්‍යතාවය ඇත.

ඉල්ලුම්පත්‍රය විභජිත ඉල්ලුම්පත්‍රයක් නම් අදාල කොටුවට කතිරයක් යොදන්න. මුල් ඉල්ලුම් පත්‍රයේ අංකය හා එය ගොනු කළ දිනය සටහන් කරන්න. මෙම කොටුව අදාල වනුයේ නව නිපැයුම් කිහිපයක් ඇත්නම් සහ එම නිපැයුම් එකී තනි නිපැයුම් සංකල්පයකට අන්තර්ගත කළ නොහැකි නම් පමණි.

# පිටු අංක - 03

## කොටු අංක IX – **පූර්ව කලා කාර්යයන් සඳහා අනාවරණය නොසලකා හැරීම**

පේටන්ට් ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමට පෙර අනාවරණය කිරීම් සිදුවිණි නම් (වසර එකක් ඇතුළත) අදාල අනාවරණය සිදුකළ දිනය සටහන් කළ යුතුය. අදාල අනාවරණය විස්තර කෙරෙන ප්‍රකාශයක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

සටහන: හෙළි නොකිරීමේ ගිවිසුමක් (non-disclosure agreement) අදාල දෙපාර්ශවය අතර අත්සන් කිරීමෙන් තොරව, නව නිපැයුමෙහි විස්තර තෙවන පාර්ශවයකට අනාවරණය නොකරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

## කොටු අංක X – **ප්‍රමුඛත්ව හිමිකම් පෑම (ඇත්නම්)**

ඉල්ලුම් පත්‍රයක් ගොනු කිරීමේදී පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) හෝ පැරිස් සම්මුතිය (ඍජු ගොනුගත කිරීම) යටතේ ඉල්ලුම් පත්‍රය ගොනු කර ඇත්නම්, මුල් ඉල්ලුම් පත්‍රය ගොනු කළ දිනය එම නිපැයුම සඳහා ප්‍රමුඛත්ව දිනය ලෙස හිමිකම් ලැබිය යුතුය.

- පේටන්ට් සහයෝගිතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ ගොනු කරන ඉල්ලුම්පත්‍ර මුල් ඉල්ලුම් පත්‍රය ගොනු කළ දින සිට මාස 30 ක් ඇතුලත ගොනු කළ යුතුය.
- පැරිස් සම්මුතිය යටතේ ගොනු කරන ඉල්ලුම් පත්‍ර මුල් ගොනු කළ දින සිට මාස 12 ක් ඇතුළත ශ්‍රී ලංකාවේ ගොනු කිරීමෙන් ප්‍රමුඛත්ව දිනය සඳහා හිමිකම් ලැබේ.

පෙර අයදුම්පත්‍රයක් සඳහා ප්‍රමුඛත්වය ඉල්ලා තිබුණි නම්, පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

| | |
|---|---|
| රට | : ඇමරිකා එක්සත් ජනපදය |
| ගොනුකළ දිනය | : (i) 2010/07/29 (ii) 2011/07/20 |
| ඉල්ලුම්පත්‍ර අංකය | : (i) 12/846, 402 (ii) PCT/US2011/044668 |
| එය කලාපීය හෝ අන්තර්ජාතික ඉල්ලුම්පත්‍රයක් නම් එය ඉදිරිපත් කළ ජාතික කාර්යාලය හෝ අන්තර් රාජ්‍ය සංවිධානය නම් කරන්න. | : ඇමරිකා එක්සත් ජනපදයේ පේටන්ට් සහ වෙළඳ ලකුණු කාර්යාලය (USPTO) |
| අන්තර් ජාතික පේටන්ට් වර්ගීකරණ සංකේතය IPC | : A61B 5/00 |

සහතික කරන ලද ප්‍රමුඛත්ව ලියවිලි ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. එහි අදාල ලියවිලි නිකුත් කරන ලද ආයතනය සඳහන් කළයුතුය.

## <u>කොටු අංක XI - **සෝදිසි වාර්තාව (අදාල කොටුවට කතිරයක් යොදන්න)**</u>

අ - අන්තර් ජාතික සෝදිසි අධිකාරියක් විසින් සපයන ලද අන්තර් ජාතික වර්ගයේ සෝදිසි වාර්තාවක් ඇත්නම් එම සෝදිසි වාර්තාවේ පිටපත් 02ක් ඇමිණිය යුතු අතර, "අ" වශයෙන් සඳහන් කොටුවේ කතිරයක් යොදා සපයා ඇති ඉඩ ප්‍රමාණයේ එම සෝදිසි අධිකාරියේ නම සඳහන් කරන්න.

ආ - අන්තර් ජාතික වර්ගයේ සෝදිසි වාර්තාවක් ඉල්ලා ඇති අතර, එය නිකුත් කළ දිනයේ සිට මාස 03ක් ඇතුලත ගොනු කරන්නේ නම් "ආ" වශයෙන් සඳහන් කොටුවේ කතිරයක් යොදා සපයා ඇති ඉඩ ප්‍රමාණයේ අදාල සෝදිසි අධිකාරියේ නම සඳහන් කරන්න.

ඇ - අන්තර් ජාතික වර්ගයේ සෝදිසි වාර්තාවක් නොමැති අතර, පූර්ව කලාව පිළිබඳ සෝදිසි කිරීම සඳහා දේශීය පරීක්ෂකවරයෙකු වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම් "ඇ" වශයෙන් සඳහන් කොටුවේ කතිරයක් යොදන්න. මේ සඳහා දේශීය සෝදිසි කිරීමේ ගාස්තු අය කරනු ඇත.

# පිටු අංක - 04

## <u>කොටු අංක XII</u>

*ඉල්ලුම්කරු විසින් මෙම නව නිපැයුම සඳහා විදේශ රටක ඉල්ලුම් පත්‍රයක් ගොනු කර ඇත්නම් එම ඉල්ලුම්පත්‍ර වලට අදාල දින හා අදාල යොමු අංකයන්ද, එම රට/රටවල් ද සඳහන් කළ යුතුය.*

*උදාහරණය.* 30/10/1995 95202935.3 <u>යුරෝපීය පේටන්ට් කාර්යාලය (European Patent Office)</u>

## <u>කොටු අංක XIII</u>

*ප්‍රකාශය*

*(ඉල්ලුම්කරු හෝ ඔහුගේ පූර්වගාමියා විසින් මෙම ඉල්ලුම්පත්‍රය ගොනු කිරීමට පෙර, අත්‍යවශ්‍යයෙන්ම මෙම නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් විදේශ රටකදී ලබානොගෙන ඇති බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටී.)*

## <u>කොටු අංක XIV – **ඉල්ලුම්කරුගේ අත්සන සහ දිනය**</u>

*ඉල්ලුම්කරුගේ අත්සන සහ දිනය යෙදිය යුතුය. සමාගමක්/ ආයතනයක්/විශ්ව විද්‍යාලයක් විසින් අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවක දී (ඉල්ලුම්කරු වන අවස්ථාවකදී) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/ ආයතන ප්‍රධානියා/ විශ්ව*

*විද්‍යාල උපකුලපති විසින් සිය අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතුය. ඉල්ලුම්කරුවන් එක් අයකුට වඩා වැඩිවන අවස්ථාවකදී, සියලුම ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය අත්සන් පැහැදිලිව යෙදිය යුතුය.*

## කොටු අංක XV – හරි වැරදි බැලීමේ ලැයිස්තුව

*(අ) පහත සඳහන් ආකෘතියට අනුව පිළියෙල කරනු ලබන පේටන්ට් පිරිවිතරය, පිටපත් 02 කින් යුක්තව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. නව නිපැයුමට අදාල විස්තරය, හිමිකම් , උද්ධෘතය සහ චිත්‍ර (ඇත්නම්) සඳහා වෙන වෙනම කොටස් වලින් පේටන්ට් පිරිවිතරය සමන්විත වියයුතුය. පේටන්ට් පිරිවිතරයේ සියළුම පිටු අංකනය කළ යුතුය.* ***<u>පැහැදිලි, සුදු වර්ණ, A4 ප්‍රමාණයේ කඩදාසි පමණක්</u>*** *භාවිතා කළ යුතු අතර පරිගණක ආශ්‍රිතව මුද්‍රණය කළ/ යතුරු ලියනය කල ලේඛන වඩාත් සුදුසු වේ. සියලුම පාඨ/පෙළ එක තීරුවකට වන සේ පිළියෙල කළ යුතුය.*

**විස්තරය**

**නව නිපැයුමෙහි හැඳින්වීමේ නම**

*මෙය ඉල්ලීමෙහි සඳහන් ආකාරයට සඳහන් කළ යුතුය. (පී 01 ආකෘතිය).*

**තාක්ෂණික ක්ෂේත්‍රය**

*එම නව නිපැයුමට අදාල තාක්ෂණික ක්ෂේත්‍රය නිශ්චිතව සඳහන් කළ යුතුය. නව නිපැයුමෙහි ක්ෂේත්‍රය මඟින් නව නිපැයුමට අදාල විෂය පථය සහ නව නිපැයුම සම්බන්ධ විෂය කරුණු විස්තර විය යුතුය.*

**පසුබිම් වූ ශිල්ප ක්‍රම**

*මෙම නව නිපැයුම අවබෝධ කරගැනීම, සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ යැයි සැලකිය හැකි ඉල්ලුම්කරු විසින් දන්නා සියලුම ඊට පසුබිම් වූ ශිල්ප ක්‍රම මෙහි සඳහන් කළ යුතුය. ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් විසින් එම ශිල්ප ක්‍රම පිළිබිඹු වන ලේඛන ගෙනහැර දැක්වීම වඩාත් සුදුසු ය. මෙම කොටස මඟින් අනිකුත් පුද්ගලයින් මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව මෙතෙක් සිදුකර ඇති දේවල් සහ පූර්ව කලා මඟින් දැනට විසඳී නොමැති ගැටළු ගැනද විස්තර කළ යුතුය. පසුබිම් තොරතුරු සම්පූර්ණ කිරීම සඳහා පූර්ව කලා පිළිබඳ විස්තර ලබා ගැනීමට ලොව පුරා දැනට ප්‍රදානය කර ඇති පේටන්ට් බලපත්‍ර සහ ගොනු කර ඇති පේටන්ට් ඉල්ලුම්පත්‍ර පිළිබඳ විස්තර ඇතුළත් පේටන්ට් දත්ත පද්ධති මෙන්ම පර්යේෂණ සම්බන්ධ ප්‍රකාශන වෙතටද යොමුවිය හැක. (පූර්ව කලාවක් යනුවෙන් අදහස් කරනුයේ මෙම වර්තමාන පේටන්ට් ඉල්ලුම්පත්‍රය ගොනු කිරීමට පූර්වයෙන් ලිඛිත ප්‍රකාශන, වාචික හෙළිකිරීම්, භාවිතය මඟින් හෝ වෙනත් ඕනෑම ක්‍රමයක් ඔස්සේ ලොව ඕනෑම තැනක මහජනයා වෙත අනාවරණය වී ඇති සියලු කරුණුය.)*

**තාක්ෂණික ගැටලුව**

*තාක්ෂණික ගැටලු සම්බන්ධ නිරවුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා නව නිපැයුම මඟින් විසඳුමක්/ විසඳුම් ලබාදෙන නිශ්චිත තාක්ෂණික ගැටලුව/ ගැටළු විස්තර කළ යුතුය.*

**තාක්ෂණික විසඳුම**

*නව නිපැයුම මඟින් ලබාදෙන විසඳුම/ විසඳුම් විස්තර කළ යුතුය.*

**චිත්‍ර පිළිබඳ කෙටි විස්තරයක්**

චිත්‍රවල රූප සටහන් ඇත්නම් ඒවා කෙටියෙන් විස්තර කළ යුතුය.

*උදාහරණ.*
*රූපසටහන 1 මඟින් අදාල නිදර්ශනයේ යථා දර්ශ පෙනුම පිළිඹිඹු කරයි.*
*රූපසටහන 2 මඟින් අදාල නිදර්ශනයේ විස්තරාත්මක පෙනුම පිළිඹිඹු කරයි.*

**නව නිපයුමෙහි වාසිදායක බලපෑම**

*දැනට පවතින විසඳුම්/නව නිපැයුම් හා සංසන්දනය කිරීමේදී මෙම නව නිපැයුමෙහි වාසිදායක බලපෑම් සම්බන්ධව සඳහන් කරන්න.*

**නව නිපැයුම ක්‍රියාවට නැගීම**

*නව නිපයුම පිළිබඳ අවබෝධ කරගැනීමට සහ පූර්ණ වශයෙන් පැහැදිලිව හා සම්පූර්ණව නව නිපැයුම පිළිබඳ ඇගයීමක් කිරීමට හැකිවන පරිද්දෙන් නව නිපැයුමෙහි නවතාවය, ඊට ඇතුලත් නව නිපැයුම්කාරී පියවර හා කාර්මික වශයෙන් යොදා ගැනීමේ හැකියාව සහ එම ශිල්ප ක්‍රමයෙහි සාමාන්‍ය නිපුණතාවයක් ඇති පුද්ගලයෙකුට ප්‍රතිනිර්මාණය කිරීමට හැකිවන ආකාරයට ඉතා පැහැදිලිව අදාලව නව නිපැයුම පිළිබඳ විස්තර අනාවරණය කළ යුතුය. නව නිපැයුම ක්‍රියාවට නැගිය හැකි වඩාත්ම සුදුසු ක්‍රමය යෝග්‍ය පරිදි නිදර්ශන යොදා ගෙන සහ චිත්‍රවලට අවධානය යොමුකරමින් විස්තර කළයුතුය.*

**කාර්මික වශයෙන් යොදා ගැනීමේ හැකියාව**

*නව නිපයුම කාර්මික වශයෙන් යොදා ගැනීමේ හැකියාව පිළිබඳව සඳහන් කරන්න.*

**හිමිකම් පෑම**

*හිමිකම් පෑමේ අරමුණ වනුයේ එමඟින් නව නිපැයුම නිර්වචනය වියයුතු අතර, පූර්ව කලා ආශ්‍රිත සැසඳීමේදී නව හා නිර්මාණශීලි (සංකීර්ණ) වන එම නිපැයුමේ ඉල්ලුම්කරුට පේටන්ට් හිමිකරු වශයෙන් ඒකාධිකාරයක් හිමිකර ගැනීමේ අවස්ථාව උදා වේ. සෑම හිමිකමක්ම තනි වාක්‍යයකින් කෙටුම්පත් කරන අතර එහි නව නිපැයුම බිහිවීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් බැඳී ඇති අත්‍යවශ්‍ය තාක්ෂණික අංග අනිවාර්යෙන් ඇතුලත් විය යුතුය. එයින් අදහස් වනුයේ අනිවාර්යෙන් එක් ප්‍රධාන හිමිකමක්වත් අන්තර්ගත විය යුතු අතර එහි සියලුම අත්‍යවශ්‍ය තාක්ෂණික අංග හා ඒවයේ අන්තර් සම්බන්ධතාවය ඇතුලත් විය යුතු බවය. අවශ්‍ය යැයි හැඟෙන්නේනම් අනිකුත් හිමිකම් මඟින් නව නිපැයුමෙහි අතිරේක අංග හඳුන්වා දිය හැක.*

*<u>වැදගත්: නව නිපැයුමෙහි තාක්ෂණික අංග සඳහා පමණක් හිමිකම් පෑම් ඉල්ලා සිටි හැකි අතර වානිජමය වාසි හෝ අනිකුත් තාක්ෂණික නොවන කරුණු සඳහන් කළ නොහැක. සෑම හිමිකම් පෑමක්ම පැහැදිලි හා සංක්ෂිප්ත විය යුතු අතර විස්තරය මඟින් එය තහවුරු විය යුතු සේම එය විස්තරය මත පාදක විය යුතුය. එයින් අදහස් කරනුයේ හිමිකම්පෑම විස්තරය තුල සම්පූර්ණයෙන් පැහැදිලි විය යුතු බවයි. හිමිකම් පෑම් කිහිපයක් තිබේනම් ඒවා අරාබි ඉලක්කම්වලින් අනුක්‍රමිකව අංකනය කළයුතු ය. හිමිකම් පෑම නිවැරදි ආකෘතිය තුල කෙටුම්පත් කළ යුතුය.</u>*

***සෑම හිමිකම් පෑමක්ම <u>හැඳින්වීම, සම්බන්ධක වචන හා ප්‍රධාන අන්තර්ගත කරුණු</u> යන අංග වලින් සමන්විත වේ.***

***හිමිකම සඳහා උදාහරණය:***

***<u>පේටන්ට් අංක: 17502</u>***

*"**<u>පරිසර හිතකාමී ආර්ථික වාසිදායි මත්ස්‍ය සම් නිෂ්පාදනය</u>**" නැමති නව නිපැයුමේ පළමු හිමිකම් දෙක පහත දැක්වේ*

1. *පරිසර හිතකාමී ආර්ථිකයට වාසිදායි ස්වභාවික වර්ණක වලින් වර්ණ ගැන්වූ මත්ස්‍යය සම් නිෂ්පාදන ක්‍රියාවලියේ ලක්ෂණ පහත පරිදි වේ.*

   *(අ) ගලවාගත් මත්ස්‍යය සම සාන්ද්‍ර ජලීය ද්‍රාවණයක ගිල්වා ඇල් වතුරෙන් සෝදා තෙත බේරා ගෙන භාෂ්මික ද්‍රාවණයක ගිල්වා තැබීම පසුව උදාසීන pH අගයක් සහිත ද්‍රවණයක් සහ දුර්වල ආම්ලික ද්‍රාවණයක් යොදාගනිමින් සම පදම් කිරීමට සුදුසු පරිදි සකසා ගැනීම;*

   *(ආ) එලෙස සකසාගත් මත්ස්‍යය සම කලින් සකස්කර ගන්නා ලද ස්වාභාවික ටැනින් ද්‍රාවණයක දින 3-4 ගිල්වා තබා උදාසීන pH අගයක් සහිත ද්‍රාවණයක් යොදාගෙන වර්ණ ගැන්වීමට සුදුසු පරිදි සකසා ගැනීම;*

   *(ඇ) නිස්සාරණය කරගන්නා ලද ස්භාවික වර්ණක සහිත ද්‍රාවණයක ඉහත සඳහන් පරිදි පදම් කරගත් මත්ස්‍ය සම් දිනක් හෝ දෙකක් බහා තබා ඔපවත් කරගැනීමක් සිදුකර ගැනීම.*

*2.පලමු හිමිකම් ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන සම පදම් කිරීමට පෙර සැකසුම් ක්‍රියාවලිය (අ) තවදුරටත් පහත ලක්ෂණ වලින් යුක්ත වේ;*

*මෙහිදී සාන්ද්‍ර ජලීය ද්‍රාවණය ලෙස ලුණු ද (NaCl) භාෂ්මික ද්‍රාවණය ලෙස කෝස්ටික් සෝඩා යොදාගැනීම, මෙහිදී උදාසීන ද්‍රාවණය ලෙස සෝඩියම් සල්ෆේට් යොදාගනු ලැබු අතර ඇසිටික් අම්ලය දුර්වල ආම්ලික ද්‍රාවණය ලෙස යොදා ගැනීම.*

- *සාමාන්‍ය යෙන් පළමු හිමිකම "ස්වාධීන හිමිකම" ලෙස හැඳින්වෙන අතර එමඟින් නව නිපැයුම සම්බන්ධ පූර්ණ අවබෝධයක් ඇතිකර ගත හැක*
- *යම්කිසි හිමිකමක්, හිමිකමක් හෝ හිමිකම් කිහිපයක් මත රඳා පවතියි නම් එවැනි හිමිකමක් පරායීන හිමිකමක් ලෙස හැඳින්වේ. සාමාන්‍යයෙන් ස්වාධින හිමිකමක පසු හිමිකම් පරායීන හිමිකම් වේ.*

## උද්ධෘතය

*උද්ධෘතය යනු නව නිපයුම පිළිබඳ කෙටි සංක්ෂේපයකි/සාරාංශයකි. එය විස්තරය, හිමිකම්පෑමේ සහ යම්කිසි චිත්‍ර අන්තර්ගත අනාවරණයේ සාරාංශයක් විය යුතුය. අනාවරණයෙන් අවකාශ සැලසී ඇති ආකාරයට උද්ධෘතය සංක්ෂිප්ත විය යුතුය ( වචන 50-150 අතර ප්‍රමාණයක උද්ධෘතයක් වඩාත් සුදුසුය)*

## චිත්‍ර

*චිත්‍ර මඟින් නව නිපැයුමක තාක්ෂණික විස්තර දැක්වෙන අතර එය දෘෂ්ටිමය වශයෙන් ද පෙන්නුම් කරයි. මෙම චිත්‍ර ඉල්ලුම්පත්‍රයක අත්‍යවශ්‍ය අංගයක් නොවේ. නව නිපැයුම, යම්කිසි දෙයක් සිදුකිරීම සඳහා ක්‍රියාවලියක් හෝ විධික්‍රමයක් හෝ නම් එවැනි අවස්ථාවක චිත්‍ර අවශ්‍ය නොවේ.*

- *චිත්‍රයක පාඨ පෙළක් අන්තර්ගත විය යුත්තේ එම අදාල චිත්‍රය අවබෝධ කරගැනීමට අවශ්‍ය වන මට්ටමට පමණි.*
- *චිත්‍රය ඇඳිය යුත්තේ නියමිත ආකාරයට වන ඉරි හා පෑන්/පැන්සල් පහර මඟින් පමණි.*
- *සියළුම ඉලක්කම් හා සමුද්දේශ රේඛා පැහැදිලිව දැක්විය යුතුය.*
- *චිත්‍ර සහිත එකම කඩදාසියක රූප සටහන් කිහිපයක් තිබිය හැක.*
- *චිත්‍ර අඩංගු කොළ අංකනය කිරීමෙන් ස්වාධීනව විවිධ රූපසටහන් අනුගාමීව අංකනය කළ යුතු ය.*
- *විස්තරයේ සඳහන් නොවන යොමු සංඥා (reference signs) චිත්‍ර වල ඇතුලත් නොවිය යුතු අතර චිත්‍රවල ඇතුළත් නොවන යොමු සංඥා විස්තරයේ ද සඳහන් නොවිය යුතුය.*
- *චිත්‍රයක යොමු සංඥා විශාල සංඛ්‍යාවක් අන්තර්ගත වේ නම්, එම යොමු සංඥා වෙනම කඩදාසියක ලැයිස්තුගත කර ඒවායින් පිළිඹිබු කරන ලක්ෂණ ද සඳහන් කරන ලෙස තරයේ නිර්දේශ කෙරේ.*
- *විශේෂයෙන් ක්‍රියාවලි ආශ්‍රිත නව නිපැයුම් සඳහා ගැලීම් සටහන් යොදා ගත හැක.*

(ආ) අදාලවන සෑම අවස්ථාවක් සඳහාම පහත ලේඛන ඇමිණිය යුතු වේ.

- ඇටෝර්නි බලය (කොටු අංක V බලන්න)
- පේටන්ට් බලපත්‍රයේ නව නිපයුම්කරුගේ නම සඳහන් නොකළ යුතු බවට ප්‍රකාශය (කොටු අංක VII බලන්න)
- පේටන්ට් බලපත්‍රයට ඉල්ලුම්කරුගේ අයිතිය යුක්තිසහගත බව ඔප්පු කරන ප්‍රකාශය (කොටු අංක VI බලන්න)
- සමහර අනාවරණ නොසලකා හැරිය යුතුබවට වූ ප්‍රකාශය (කොටු අංක IX බලන්න)
- අන්තර් ජාතික වර්ගයේ සෝදිසි වාර්තාව (කොටු අංක XI බලන්න)
- ප්‍රමුඛතා ලියවිලි (කොටු අංක X බලන්න)
- ඉල්ලුම් පත්‍රයේ ගාස්තුව ගෙවීම සඳහා මුදල්, චෙක්පතක්, මුදල් ඇණවුමක්, බැංකු අණකරයක් හෝ තැපැල් ඇණවුමක් යොදාගත හැක.
- සෝදිසි ගාස්තුව (ගාස්තු ව්‍යුහය බලන්න)
- අනිකුත් ලියවිලි (පැහැදිලිව සඳහන් කරන්න)